රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 16/2022(II)

මගේ අංකය : EST-6/03/LEA/1060
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2022.07.24

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රජයේ කාර්යාල වෙත නිලධරයන් කැඳවීම සීමා කිරීම

උක්ත මැයෙන් නැවත දැනුම්දෙන තුරු බලාත්මක වන සේ නිකුත් කළ 2022.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2022(I) සහ 2022.06.20 දින සිට සති දෙකක කාලයක් සඳහා බලාත්මක වන සේ නිකුත් කළ 2022.06.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2022 සහ 2022.06.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2022 යන චක්‍රලේඛ වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2022 හි විධිවිධාන සති දෙකක කාලසීමාවකට අදාළ වන පරිදි නිකුත් කළ ද එම සති දෙක ඉකුත් වීමෙන් පසු කාලසීමාව සහ දැනට පවතින තත්ත්වය සැලකිල්ලට ගෙන එම චක්‍රලේඛයෙහි විධිවිධාන සහ 16/2022(I) චක්‍රලේඛයෙහි විධිවිධාන මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන 2022.07.24 දිනය තෙක් සහ එදින සිට ඉදිරි මාසයක කාලසීමාවක් සඳහා වලංගු සේ සලකා ක්‍රියා කළ යුතු ය.

03. සේවයට වාර්තා කිරීමේ දී රජයේ නිලධරයන් විසින් මුහුණ දෙනු ලබන අපහසුතා සැලකිල්ලට ගෙන ඒ සඳහා සහන සැලසීමට මෙම අමාත්‍යාංශය මඟින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ වැරදි ලෙස උපයෝගී කොටගෙන සේවයට වාර්තා කළ හැකි නිලධරයන් ද සේවයට වාර්තා නොකරන තත්ත්වයක් උද්ගත නොවීමට වගබලා ගත යුතු ය.

04. රට තුළ පවතින ඉන්ධන හිඟය මඟහැරවීම සඳහා ඉන්ධන බෙදීම යථාවත් කෙරෙමින් පවතින අතර, ඒ අනුව ඉදිරි දිනවල දී පොදු ප්‍රවාහන සේවාවන් ද ක්‍රමක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වනු ඇත. එකී කරුණු සැලකිල්ලට ගෙන මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉටු කළ නොහැකි රාජකාරි සඳහා හා අත්‍යවශ්‍ය මහජන සේවා පවත්වාගෙන යාමට අවශ්‍ය කාර්යය මණ්ඩලය කැඳවීමට මෙම චක්‍රලේඛ විධිවිධාන බාධාවක් නොවන බැව් වැඩිදුරටත් දන්වමි.

05. 2022.07.22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළඹි තීරණය අනුව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

Digitally signed by
M M P K Mayadunne
Date: 2022.07.24
11:53:00 +05'30'

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය